0131

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධි පාඨමාලාව

අදියර 4
**AFU4572 - සාර්ව ආර්ථික විද්‍යාව**
අවසාන පරීක්ෂණය - 2025/2026
කාලය - පැය තුනයි (03)

---

*දිනය: 2026 ජුනි 27* *වේලාව: පෙ.ව. 9.30 - ප.ව. 12.30*

---

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත වේ.
- ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු හිමිවේ.
- කරුණාකර ඔබේ විභාග අංකය (Index Number) පිළිතුරු පත්‍රයේ ලබා දී ඇති ඉඩෙහි දක්වන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය මුද්‍රිත පිටු තුනකින් (03) සමන්විත වේ.
- පිළිතුරු පත්‍රය ඔබේ පිළිතුරු පොත් පිංචට අමුණන්න.
- වැඩසටහන් සම්පාදනය කළ නොහැකි (non-programable) ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ඇත.

<u>ප්‍රශ්න අංක 01</u>

අ) "ව්‍යාපාර කළමනාකරුවෙකුට ඵලදායී ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සාර්ව ආර්ථික විද්‍යාව (Macroeconomics) පිළිබඳ මනා දැනුමක් තිබීම වැදගත් වේ".
දේශීය ආර්ථිකයේ වත්මන් සාර්ව ආර්ථික ප්‍රවණතා සමඟ ඔබේ පැහැදිලි කිරීම සම්බන්ධ කරමින් විස්තර කරන්න. **(ලකුණු 10)**

ආ) පහත ප්‍රකාශයන් සමඟ ඔබ එකඟ වන්නේදැයි පැහැදිලි කරන්න. (අවශ්‍ය තැන්හිදී රූප සටහන්/ප්‍රස්ථාර ඇසුරින් පැහැදිලි කරන්න).

i. ආර්ථික වර්ධන කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ප්‍රසාරණාත්මක මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති (Expansionary fiscal and monetary policies) භාවිත කල යුතුය.

ii. සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති (Supply side policies) මඟින් අපේක්ෂා කරන්නේ ආර්ථිකයක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමයි. **(ලකුණු 10)**

<u>ප්‍රශ්න අංක 02</u>

අ) i. සමස්ත ඉල්ලුමේ (Aggregate Demand - AD) සංරචක මොනවාද?
ප්‍රධාන ආර්ථික අංශ හරහා මෙම සංරචක අතර මුදල්, සම්පත් සහ නිෂ්පාදිත සංසරණය වන ආකාරය චක්‍රීය ප්‍රවාහ සටහනක් (Circular flow diagram) ඇසුරින් පෙන්වන්න. **(ලකුණු 06)**

ii. අ. නාමික දළ දේශීය නිෂ්පාදිතය (Nominal Gross Domestic Product) සහ සැබෑ (තාත්වික) දළ දේශීය නිෂ්පාදිතය (Real Gross Domestic Product) අතර වෙනස හඳුනාගන්න.

ආ. රටක ආර්ථික වර්ධනය සහ යහපැවැත්ම (well-being) මැනීම සඳහා සැබෑ (තාත්වික) දළ දේශීය නිෂ්පාදිතය වඩා හොඳ මිනුමක් වන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) පහත ප්‍රකාශ සමඟ ඔබ එකඟ වන්නේදැයි පැහැදිලි කරන්න.

**i.** බදු ගුණකය (Tax multiplier) සෑම විටම වැය (වියදම්) ගුණකයට (Expenditure multiplier) වඩා අඩුය.

**ii.** ආර්ථිකයක ඇති අංශ සංඛ්‍යාව (Number of sectors) වැඩි වන තරමට, වැය ගුණකය ද වැඩි වේ. (ලකුණු 08)

ප්‍රශ්න අංක 03

අ) **i.** ජාතික ආදායම මැනීමේ ප්‍රධාන ප්‍රවේශයන් හඳුනාගන්න. (ලකුණු 03)

**ii.** ජාතික ආදායම මැනීමේදී ඇති වන සීමාවන් මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

ආ) අංශ තුනක ආර්ථිකයක (Three-sector economy) විස්තර පහත පරිදි වේ; (සංඛ්‍යා රුපියල් බිලියන වලින්).

$C = 148 + bY_d$ (පරිභෝජන ශ්‍රිතය - Consumption Function)
MPS = 0.2 (ආන්තික ඉතුරුම් නැඹියාව - Marginal Propensity to Save)
I = 108 (ස්වායත්ත ආයෝජන - Autonomous Investments)
T = 10 (ස්වායත්ත බදු - Autonomous Taxes)
G = 92 (ස්වායත්ත රජයේ වැය - Autonomous Government expenditure)

**i.** පරිභෝජන ශ්‍රිතය (Consumption function) සහ ඉතුරුම් ශ්‍රිතය (Savings function) වෙන වෙනම භාවිතා කරමින් ජාතික ආදායමේ (NI) සමතුලිත මට්ටම ගණනය කරන්න. (ලකුණු 04)

**ii.** ස්වාධීන බදු වලට අමතරව, රජය 10% ක ආදායම් බද්දක් හඳුන්වා දෙන්නේ නම්, ජාතික ආදායමේ (NI) නව සමතුලිත මට්ටම සොයන්න. (ලකුණු 03)

**iii.** වැය ගුණකය (Expenditure multiplier) සහ බදු ගුණකය (Tax multiplier) ගණනය කරන්න. (ලකුණු 02)

**iv.** ආර්ථිකය විවෘත වන අතර පහත සඳහන් වෙනස්කම් සිදුවේ යැයි උපකල්පනය කරන්න:
X = 32 (ස්වාධීන අපනයන - Autonomous Exports)
M = 36 + 0.1Y (ආනයන ශ්‍රිතය - Import Function)
ජාතික ආදායමේ (NI) සමතුලිත මට්ටම සොයන්න. (ලකුණු 04)

<u>ප්‍රශ්න අංක 04</u>

අ) **i.** භාණ්ඩ හුවමාරු ක්‍රමය (Barter system) ආශ්‍රිත ප්‍රධාන දුෂ්කරතා/අඩුපාඩු මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 03)

**ii.** මුදලේ කාර්යයන් හඳුනා ගෙන, මුදල් හඳුන්වාදීම භාණ්ඩ හුවමාරු ක්‍රමයේ අඩුපාඩු මඟහරවා ගැනීමට උපකාරී වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

**iii.** "පටු" (Narrow money supply - M1) සහ "පුළුල්" (Broad money supply - M2) මුදල් සැපයුම අතර වෙනස හඳුනාගන්න. (ලකුණු 03)

ආ) **i.** වාණිජ බැංකු වල ප්‍රධාන කාර්යයන් කිහිපයක් හඳුනාගන්න. (ලකුණු 04)

ii. සංචිත අවශ්‍යතාවය (Reserve requirement) සපුරාලීම වාණිජ බැංකුවල මුදල් මැවීමේ හැකියාවට බලපාන්නේ කෙසේද? වාණිජ බැංකු මඟින් මුදල් මැවීමේදී ඇති වන ප්‍රධාන සීමාවන් හඳුනාගන්න. (ලකුණු 06)

ප්‍රශ්න අංක 05

අ) i. "IS" (ආයෝජන-ඉතිරිකිරීම්) සහ "LM" (ද්‍රවශීලතා අභිරුචිය-මුදල් සැපයුම) වක්‍ර මඟින් නිරූපණය වන්නේ කුමක්ද? (ලකුණු 03)

ii. "IS" වක්‍රය සෘණාත්මක බෑවුමක් (Negatively sloped) ගන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) IS/LM (ආයෝජන-ඉතිරිකිරීම් / ද්‍රවශීලතා අභිරුචිය-මුදල් සැපයුම) රාමුව භාවිතා කරමින් පහත සඳහන් වෙනස්කම් ආර්ථිකයට ඇති කරන බලපෑම පැහැදිලි කරන්න.

i. පූර්ණ සේවා (රැකියා) නියුක්තිය ළඟා කර ගැනීම සඳහා රජය ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත.

ii. මහ බැංකුව වාණිජ බැංකුවල සංචිත අවශ්‍යතාවය අඩු කර ඇත.

iii. ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටම පහත වැටී ඇත.

iv. ආර්ථිකයේ උද්ධමනය පාලනය කිරීම සඳහා දැඩි ණය ප්‍රතිපත්තියක් භාවිතා කර ඇත. (ලකුණු 10)

ඇ) මුදල් සඳහා වන ඉල්ලුම පොලී අනුපාතිකය මත සම්පූර්ණයෙන්ම රඳා නොපවතින විට, ආර්ථිකයක ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා වඩාත්ම ඵලදායී ප්‍රතිපත්ති මොනවාද? රූපසටහන්/ප්‍රස්ථාර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ප්‍රශ්න අංක 06

අ) i. රූපසටහන්/ප්‍රස්ථාර භාවිතයෙන් "ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය" (Demand Pull Inflation) සහ "පිරිවෙන් තල්ලු වූ උද්ධමනය" (Cost Push inflation) අතර වෙනස හඳුනාගන්න. (ලකුණු 05)

ii. ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ මුදල් ඒකක වලට සාපේක්ෂව දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වීම (Depreciation of the domestic currency) ලබා දී ඇති දේශීය ආර්ථිකයක සාමාන්‍ය මිල මට්ටමට බලපාන්නේ කෙසේද?
ශ්‍රී ලංකා ආර්ථිකය උදාහරණයකට ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) පහත දැක්වෙන සංකල්ප අතර වෙනස හඳුනාගන්න:

i. මූලික උද්ධමනය (Core inflation) සහ මතුපිට උද්ධමනය (Headline inflation).

ii. අපේක්ෂිත උද්ධමනය (Anticipated inflation) සහ අනපේක්ෂිත උද්ධමනය (Unanticipated inflation). (ලකුණු 06)

ඇ) ඉහළ උද්ධමනයක් පැවතීම රටක සමාජයේ පහළම ස්ථරයට (Lowest strata of society) අයත් ජනතාවට බලපාන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 03)

*- සියලුම හිමිකම් ඇවිරිණි -*